# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/83/2025 (NPC)

අප්පුවාහන්දි ජයමල්,

**අභියාචක**

**එදිරිව**

ජාතික පොලිසන් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.02.19**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් නීතිඥ ප්‍රින්ස් පෙරේරා මහතා,
වගඋත්තරකාර නියෝජ්‍ය අධ්‍යක්ෂක, මාලා බස්නායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති, **2025.06.12** දිනැති අභියාචන පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබූ විනය නියෝගය ඉවත් කර, පනවා ඇති වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමේ දඬුවම ඉවත් කර දෙන ලෙසයි. මෙම අභියාචනය විමසීමට ගත් අවස්ථාවේ දී නීතිඥ ප්‍රින්ස් පෙරේරා මහතා දන්වා සිටින්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා සඳහා මුල් අවස්ථාවේ දීම ඔහු වරද පිළිගෙන ඇති බවයි. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනාව වන්නේ, එම්.උදිත කුමාර යන අය අත් අඩංගුවට ගෙන, ඔහු සේවය කළ ස්ථානයට ගෙන යාම සහ එම තැනැත්තා

පොලිස් ස්ථානයෙන් පිටතට ගෙනයාම සම්බන්ධයෙන්, අභියාචක විසින් අදාළ ලේඛනයන්හි සටහන් යොදා නොතිබීමත්ය. සියළුම චෝදනා එම කරුණු මත පදනම් කරගෙන ඇත.

ඉදිරිපත් කරන ලද කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ, අභියාචක විසින් ඉහත නම් සඳහන් අය එම ස්ථානයට රැගෙන ගොස් ඇත්තේ, හෙරොයින් ලග තබා ගැනීම සම්බන්ධයෙන් වන නඩුවක් පිළිබඳව වන විමර්ශන පැවැත්වීම සඳහාය. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳව සළකා බැලීමෙන් පසු, බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් දඩුවමක් ලෙස ආයතන සංග්‍රහයේ දෙවන වෙළුමේ, XLVIII පරිච්ඡේදයේ **24:2:1** උප වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින්, "***අවවාදය***" නැමැති දඬුවම නියම කර ඇත. එම දඬුවම ඉවත් කර ගැනීම සඳහා අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබූ අභියාචනය සළකා බැලීමෙන් පසුව, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීම යන විනය දඬුවම පනවමින්, නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ විනය දඬුවම ඉහළ දමමින් වෙනස් කර ඇත. එබැවින් මෙහිදී සළකා බැලිය යුතු වන්නේ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ලබාදී ඇති විනය දඬුවම නිවැරදිද ද යන කරුණයි.

අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සළකා බැලීමෙන් පසුව, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත්තේ, **(2025.05.29** දින ලිපිය අනුව) විනය බලධාරියා විසින්, **2022.03.09** දිනැති විනය නියෝගය මගින් ලබා දී ඇති "**අවවාද කරමි**" යන නියෝගය, ඉන්පසුව **2022.11.10** දින කරන ලද විනය නියෝග මගින් ප්‍රතිශෝධනය කර ඇති නිසා, එම පසුව කරන ලද නියෝගය ඒ ආකාරයෙන් පැවතිය යුතු බවයි. ඒ අනුව **2022.11.10** දිනැති ප්‍රතිශෝධිත විනය නියෝගයට අවධානය යොමු කරන ලදි. එම නියෝගය නිකුත් කර ඇත්තේ, ඉහත කී **2022.03.09** දිනැති නියෝගය නිකුත් කර ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින්මය. ඒ අනුව **2022.11.10** දිනැති සංශෝධිත විනය නියෝගය එකම විනය බලධාරියා විසින් අවස්ථා දෙකකදී වෙනස් කරමින් සංශෝධනය කර ඇත. ඒ ආකාරයට කලින් ලබා දී තිබූ විනය නියෝගයක්, එම නිලධාරියා විසින්ම කිසිදු හේතුවක් නොදක්වා සංශෝධනය කිරීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව අවකාශ ලැබෙන්නේ නැත. මෙම

තත්ත්වය ආයතන සංග්‍රහහයේ දෙවන වෙළුමේ, XLVIII පරිච්ඡේදයේ **26:1** වගන්තියෙහි සඳහන් වේ. එකී **26:1** වගන්තියට අනුව එකම විනය බලධාරියා විසින් කටයුතු කළ හැකි වන්නේ, එම නියෝගයේ පවත්නා දෝෂයක්, අක්‍රමවත් බවක්, හෝ එම නියෝගයේ නිවැරදි කිරීමක් සඳහා පමණි. කෙසේ වෙතත්, එකම බලධරයා විසින් නිකුත් කරන ලද විනය නියෝගයක්, ප්‍රතිශෝධනය කිරීමට, හෝ වෙනස් කිරීමට හෝ අහෝසි කිරීමට එම විනය බලධාරියා විසින් ඉහත සඳහන් පරිදි තීරණය කරන ලද අවස්ථාවක දී; ඊට පදනම් වූ සියළු කරුණු පැහැදිලිව හා නිවැරදිව අදාළ විනය ගොනුවේ සටහන් කර තැබිය යුතුය. මෙම අවස්ථාවේ දී විනය නියෝගය නිකුත් කර ඇති විනය බලධාරියා, දෙවන වරට නිකුත් කරන ලද සංශෝධිත විනය නියෝගය නිකුත් කිරීමේ දී, ඉහත සඳහන් ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසළකා හැර ඇත. එකී වෙනස් කිරීම කුමන හේතුවක් මත කරන ලද්දක්දැයි සංශෝධිත විනය නියෝගයේ සඳහන් නොවේ. ඉහත කී කරුණු කෙරෙහි ජාතික පොලිස් කොමිෂන් සභාවේ අවධානය යොමු වී නැත. එසේ අවධානය යොමු නොකරමින්, දෙවන අවස්ථාවේ නිකුත් කරන ලද විනය නියෝගය ස්ථිර කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව පියවර ගෙන ඇත. ඉහත කරුණු එම අවස්ථාවේ දී ජාතික පොලිස් කොමිෂන් සභාවේ අවධානයට යොමු වී නොමැති බවට පෙනී යන හෙයින්, මෙම අවස්ථාවේ දී එම දෝෂය නිවැරදි කිරීමට තීරණය කරමු.

ඒ අනුව බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් **2022.11.10** දිනැතිව අභියාචකට එරෙහිව නිකුත් කරන ලද විනය නියෝගය අවලංගු කර එකී නියෝගය ශූන්‍ය බවට පත්කරමු. පසුව නිකුත් කරන ලද නියෝගය බලයෙන් පිටතව කරන ලද නියෝගයක් ලෙසට තීරණය කරමු. ඒ සමගම එම නිලධාරියා විසින්ම අභියාචක වෙත නිකුත් කර ඇති **2022.03.09** දිනැති විනය නියෝගය ඒ ආකාරයෙන් බලපැවැත්විය යුතු බවටද තවදුරටත් නියම කරමු.

ඉහත තීරණය හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් **2025.05.25** වෙනි දින නිකුත් කර ඇති විනය නියෝගයද අවලංගු කරමු.

ඉහත නියෝගය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

ඉහත කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දෙමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-